සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල

2021 ජුනි 14 සිට ජුනි 20 දක්වා සතිය

සතිය - 07

විෂය - මව්බස

ශ්‍රේණිය - 2

සැකසුම :- ඩබ්.එම්.පියසීලි මිය /ර/ඇඹි /මාදම්පේ විජය ම.වි. 2 ශ්‍රේණිය බාර

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## කතාව කියවන්න

"පොරොන්දුවක්? ඒ මොකක් ද?" අන්දරේ ඇහුවා.

"මඟුල් ගෙදර ගියා ම විහිළු තහළු කරන්නෙ නැතුව ගොනා වගේ ඉන්න ඕනෑ," අන්දරේගෙ අම්මා කිව්වා.

"හා, හොඳයි අම්මෙ. මං අම්මා කියන විදියට ම ගොනා වගේ ම ඉන්නම්කො," අන්දරේ ඔළුව ඒ පැත්තට මේ පැත්තට වන වනා එකඟ වුණා.

මඟුල් ගෙදරට ගියාට පස්සෙ අන්දරේ අම්මයි, තාත්තයි එක්ක දුන්න කෑම බීම කාලා, බීලා, පැත්තකට වෙලා ඉඳගෙන හිටියා.

අන්දරේ එහෙම ඉන්නවා දැක්කා ම අන්දරේගෙ අම්මා සතුටු වුණා. හැමෝ ම සන්තෝෂයෙන් කතා කර කර හිනා වෙවී හොඳ විනෝදයෙන් හිටියා.

## මඟුල් ගෙදර ගොනෙක්

ගමේ ළඟ පහළ මඟුල් ගෙදරකට අන්දරේලගෙ පවුලටත් ආරාධනා ලැබුණා. පුංචි අන්දරේටත් මඟුල් ගෙදර යන්න ඕනෑ වුණා. ඒත් අන්දරේගෙ දඟකාරකම් ගැන ඔහුගෙ අම්මා හොඳින් දන්න හින්දා පුංචි අන්දරේව මඟුල් ගෙදර එක්කර ගෙන යන්න කැමති වුණේ නෑ. ඈ මඟුල් ගෙදර යන්න ලෑස්ති වෙන කොට,

"මාත් මඟුල් ගෙදර යන්න ඕනෑ," අන්දරේ කියන්න වුණා.

"හොඳයි මං එක්කර ගෙන යන්නම්, ඒත් එක පොරොන්දුවක් පිට," අන්දරේගෙ අම්මා කිව්වා.

"යන්තම් ඇති. අද මගෙ පුතා හොඳයි, කියපු විදියට ඉන්නවා," කියලා හිතමින් අන්දරේගෙ අම්මා ගේ ඇතුළට ගියා අන්දරේ එහෙම ඉඳිද්දි. වැඩි වෙලාවක් ගියෙ නෑ. මඟුල් ගෙදර ඉස්සරහ පැත්තේ මහ කලබලයක්! අන්දරේගෙ අම්මත් ගේ ඇතුළේ ඉඳන් ඉස්සරහට දුවගෙන ආවා මොකද කියලා බලන්න.

ඈට දකින්න ලැබුණේ මොකක් ද? ඈ දැක්කා අන්දරේ දණ ගහ ගෙන නැමිලා ළඟ ඉන්න ගෑනු-පිරිමි, ලොකු-පුංචි හැම දෙනාට ම ඔළුවෙන් ඇනගෙන ඇනගෙන යනවා. ඔළුව ඒ අතට මේ අතට නවනවා, ඇස් කරකවලා ඔළුවෙන් අනිනවා. ඉක්මනට ඈ අන්දරේ අල්ලා ගත්තා.

"මොකක් ද මේ කරන්නෙ පුතේ? පුතාට මතක නැද්ද මඟුල් ගෙදර එන්න කලින් මං කිව්ව දේ?" අම්මා ඇහුවා.

“මට මතකයි අම්මේ,” අන්දරේ කිව්වා.

“ඉතින් එහෙනම් මොකද මේ අයට මේ කරදර කරන්නෙ?”

“ඇයි අම්මා නෙ කිව්වෙ මට ගොනා වගේ ඉන්න කියලා. ඉතින් ඒක මතක් වෙලා මං ගොනා වගේ මිනිසුන්ට ඔළුවෙන් ඇන්නා,” අන්දරේ කිව්වා. එතකොට හැමෝ ම හිනා වෙන්න ගත්තා.

1) මෙම කථාව කීප වරක් හඬ නගා කියවන්න?
2) මෙම කතාවේ දක්වා ඇති විරාම ලක්ෂණ ලියන්න?

| විරාම ලක්ෂණය | එහි නම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

3)පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න?

1) කුඩා අන්දරේගෙන් අම්මා ඉල්ලූ ඉල්ලීම කුමක්ද?.........................................

2) අන්දරේ මඟුල් ගෙදර හැසුරුනු ආකාරය ලියන්න?

...............................................................................................................

3)මෙම කතාවේ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න?

4) වැඩියන්ගෙන් මෙවන් තවත් අන්දරේ පිළිබඳ කතාවක් අසා දැන ගන්න?